# මැතිවරණ දෙපාර්තමේන්තුව

## தேர்தல்கள் திணைக்களம்


පොදු කාර්යාලය - 2868441-3
பொது அலுவலகம்

මැතිවරණ කොමසාරිස් - 2868444
தேர்தல்கள் ஆணையாளர் ෆැක්ස් தொலை நகல் 2868445

සහකාර කොමසාරිස් (පාලන) 2868450
உதவி ஆணையாளர் (நிருவாகம்) ෆැක්ස් (தொலை நகல்) 2868450

මැතිවරණ මහලේකම් කාර්යාලය,
තැ.පෙ. 2,
රාජගිරිය. 10107
தேர்தல்கள் செயலகம்,
த. பெ. 2,
இராஜகிரிய. 10107


මගේ අංකය: LAE/11/24
எனது இல:
ඔබේ අංකය :
உமது இல:
දිනය : 2011.01

**<u>චක්‍රලේඛ අංක TR/2011/01 (II)</u>**

**ඉතා වැදගත්ය. හදිසියි.**

.............................................,
............................................
............................................

**<u>පළාත් පාලන මැතිවරණය - 2011.</u>**

**<u>රජයේ වාහන ලබාදීම.</u>**

**ඉදිරියේදී පැවැත්වීමට නියමිත පළාත් පාලන ඡන්ද විමසීමේදී ඡන්ද පොළ වලට හා ඒවායේ සිට නිලධාරීන් , උපකරණ, ලිපිද්‍රව්‍ය ආදිය ප්‍රවාහනය කිරීම සඳහා දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන්ට (කාර්, ජීප්, ස්ටේෂන් වැගන්, වෑන්, ඩබල් කැබ්,ක්‍රෘ කැබ්,බස්, ලොරි) ආදී වශයෙන් මෝටර් රථ වාහන විශාල සංඛ්‍යාවක් අවශ්‍ය වේ. එබැවින් ඔබ ආයතනය සතු මනා ධාවන තත්වයෙන් යුත්, හැකි සෑම මෝටර් වාහනයක්ම ඉහත සඳහන් ඡන්ද විමසීමේදී පාවිච්චි කිරීම සඳහා යොදාගැනීම පිණිස මා වෙත ලබාදෙන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.**

02. ඔබ ආයතනය සතුව ඇති මනා ධාවන තත්වයකින් යුත් සියළුම වාහන පිළිබඳ විස්තර මෙයට යාකර ඇති වාහන සංගණන පත්‍රිකා මඟින් **මෙම චක්‍රලේඛය ලැබී සති දෙකක් ඇතුළත** රාජගිරිය, මැතිවරණ මහලේකම් කාර්යාලයේ, සහකාර මැතිවරණ කොමසාරිස් (පාලන) වෙත ලබාදෙන ලෙස කාරුණිකව දන්වමි.

03. අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ සංස්ථාවන්හි සභාපතිවරුන් සහ ස්ථානාධිපතිවරුන් යන නිලධාරීන්ට එක් වාහනයක් බැගින් වන පරිදි, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 අනුව වෙන් කර ඇති වාහන හැර අනෙකුත් සියළුම වාහන ඡන්ද විමසීමේ කටයුතු සඳහා ලබාදිය යුතු වාහන සේ සලකා කටයුතු කළ යුතු බවට ඔබගේ ප්‍රවාහන විෂය භාර මාණ්ඩලික නිලධාරියා දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

04. පසුගිය ඡන්ද විමසීම් වලින් පසු දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් විසින් මා වෙත එවා ඇති වාර්තාවන් අනුව පෙනිගිය එක් කරුණක් වනුයේ මවිසින් ඒ ඒ දිස්ත්‍රික් තේරීම්භාර නිලධාරීන් වෙත කොළඹ සංචිතයෙන් වෙන්කර දුන්, ඇතැම් ආයතන විසින් ලැයිස්තු ගත කර විස්තර ලබාදෙන ලද වාහන අතුරින් වාහන එකක් හෝ කිපයක් හෝ විවිධ හේතුන් ඉදිරිපත් කර අදාළ තේරීම් භාර නිලධාරී වෙත යැවීමට කටයුතු කර නොමැති බවය. මේ හේතුවෙන් දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් දැඩි අපහසුතාවයන්ට පත්වූ බවට මා වෙත වාර්තා කර ඇත. එබැවින් සෑම ආයතන ප්‍රධානියකු විසින්ම තමන් විසින් විස්තර ලබාදුන් වාහන සියල්ලම අදාල දිනයේ තේරීම්භාර නිලධාරීන් දැනුම් දුන් පරිදි යැවීමට කටයුතු කළ යුතු බවට වග බලා ගත යුතු බවට උපදෙස් දෙන්න. (ඒ ඒ වාහන වෙන්කරනු ලබන්නේ කුමන දිස්ත්‍රික්කයක් වෙතද යන්න පසුව දැනුම් දෙනු ලැබේ). ඡන්ද විමසීම් කටයුතු සඳහා රාජ්‍ය ආයතන සතු වාහන ලබාදීම එම ආයතන ප්‍රධානීන් සතු වගකීමක් බව ජනාධිපති ලේකම්වරයා විසින් මටද පිටපතක් සහිතව අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් ප්‍රධාන ලේකම්වරුන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන් වෙත සීඑස්ඒ/10/08/11 හා 2009.02.17 දිනැති ලිපියෙන් උපදෙස් ලබාදී ඇති බවද සිහිපත් කරනු කැමැත්තෙමි.

05. වාහන පිළිබඳ ලැයිස්තු යැවීමේ වගකීම අමාත්‍යාංශයක් සම්බන්ධයෙන් නම් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයෙකුගේද, දෙපාර්තමේන්තුවක් සම්බන්ධයෙන් නම් අතිරේක හෝ නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියකුගේද, ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සංස්ථාවක් සම්බන්ධයෙන් නම් අතිරේක සාමාන්‍යාධිකාරීවරයෙකුගේද තත්වයට නොඅඩු නිලයක් දරණ නිලධාරියකු වෙත පැවරිය යුතුය. 17 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (4) අ ව්‍යවස්ථාවට අනුව රාජ්‍ය දේපළ වන මෙකී වාහන අනිසි ලෙස භාවිතා කිරීමක් සිදු නොවන ලෙසට වග බලා ගැනීම සඳහා සියළුම වාහන පිළිබඳ විස්තර ලබාදීමට සෑම ආයතන ප්‍රධානියකුම කටයුතු කළ යුතුය.

06. සාමාන්‍යයෙන් ඡන්ද විමසීම පැවැත්වෙන දිනට කලින් සම්පූර්ණ දින තුනක කාල සීමාවක් සඳහා මෙම මෝටර් රථ වාහන අවශ්‍ය වන අතර ඡන්ද විමසීම පවතින දිනයට පසු දෙවැනි දිනයේ ඒවා ආපසු මුදා හරිනු ඇත.

07. බොහෝ සේ අබලන් වීම නිසා හෝ බරපතල හදිසි අනතුරු වලට භාජනය වීම නිසා හෝ මුළුමනින්ම අළුත්වැඩියා කළ යුතු වාහන හැර අනෙකුත් සියළුම වාහන විස්තර මේ සමඟ අමුණා ඇති ආකෘතියට ඇතුලත් කළ යුතුය. තවද ඔබ විස්තර ඉදිරිපත් කල වාහන පරීක්ෂා කර බලා අවශ්‍ය වන්නේ නම් ඒවායෙහි කළ යුතු සුලු අළුත්වැඩියාවන් හෝ සේවා කිරීම් ඇත්තේ නම් ඒවා සිදු කොට ඡන්ද විමසීමේ රාජකාරී කටයුතු වල යෙදවීම සඳහා ඡන්ද විමසීමේ දිනයට යටත් පිරිසෙයින් සතියකට වත් පෙර සූදානම් කර තැබිය යුතුය.

08. **දිස්ත්‍රික් තේරීම් භාර නිලධාරීන් (දිස්ත්‍රික් ලේකම්වරුන්) වෙත කොළඹ සංචිතයෙන් වෙන්කර දෙනු ලබන වාහන සඳහා අවශ්‍ය ඉන්ධන ලිහිසි තෙල් ආදිය තේරීම් භාර නිලධාරීන් විසින් ඉන්ධන ඇණවුම් මඟින් සැපයීමට කටයුතු සලස්වනවා ඇත. වාහන අයත් ආයතනය විසින් එම වාහන වෙන්කර ඇති දිස්ත්‍රික්කයේ තේරීම් භාර නිලධාරීන්ගේ කාර්යාලයට වාර්තා කිරීමට යාමට**

**පමණක් ප්‍රමාණවත් ඉන්ධන පමණක් ලබාදිය යුතුය. එම ඉන්ධන සඳහා වැය වූ මුදල මැතිවරණ වැය ශීර්ෂ යටතේ මැතිවරණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිපූරණය කරනු ඇත.** ඉන්ධන ප්‍රතිපූරණය කිරීම, රියදුරන්ගේ අතිකාල හා සංයුක්ත දීමනා ගෙවීම සහ ඡන්ද විමසීම් රාජකාරිවල නිරත කරවන කාර්ය මණ්ඩලයට ගෙවීම් කිරීම පිළිබඳ උපදෙස් ඇතුළත් චක්‍රලේඛයක් පසුව නිකුත් කරනු ඇත.

09. සියළුම රියදුරන්ට හා රිය ශෝධකයන්ට තැපැලෙන් ඡන්දය දීමේ පහසුකම් සලසා ගැනීමට හිමිකම් තිබේ.එබැවින් ඔබ ආයතනයේ සියළුම රියදුරන් හා රිය ශෝධකයින් මේ පිළිබඳව දැනුවත් කිරීමට කරුණාකර කටයුතු කරන්න.

10. 17 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් සංශෝධිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 (ඊ) 1 ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල පරිදි මෙම චක්‍රලේඛණය නිකුත් කරනු ලැබේ.

11. මෙම ඡන්ද විමසීම සාර්ථක කර ගැනීම සඳහා ඔබ සියළු දෙනාගෙන් ලැබෙන සහය බෙහෙවින් අගය කොට සලකමි.

**දයානන්ද දිසානායක,**
මැතිවරණ කොමසාරිස්.